ශීර්ෂය 267 - මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
----------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝබර් 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම
-----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.
වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ වටිනාකම් සමග සසඳා ඉදිරිපත් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් ලැබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල ආදායම් ගිණුම් තැබීමේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් දක්වන ලද රජයේ නිලධාරීන් සඳහා නිවාස හා නේවාසිකාගාරවලින් අයකළ කුලී ආදායම් එකතුව රු.846,136ක් මූල්‍ය ප්රකාශනවල ආකෘති අංක ඒසීඒ-1හි ඉදිරිපත් කර නොමැතිව අත්හැරී තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කුලී ආදායම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

#### (ආ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාල පුනරාවර්තන වියදම් ගිණුම් තැබීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ගෙවනු ලැබූ වැටුප්, කුලී හා අනෙකුත් සේවක සුභසාධන සම්බන්ධයෙන් භාණ්ඩාගාර පොත්වල එකතුව රු. 162,924,486 ක් ලෙසත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එකතුව රු. 162,707,416 ක් ලෙසත් දැක්වීම නිසා එකතුව රු. 217,070 ක වෙනසක් නිරීක්ෂණය විය. | විචලනයන් සඳහා හේතු සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

## (ඇ) රජයේ නිලධාරීන් සඳහා වූ අත්තිකාරම් ගිණුම් ශේෂ

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවය අත්හිටවූ, විශ්‍රාම ගිය, සේවය අත්හැර ගිය, මියගිය නිලධාරීන්ගේ හිඟහිටි සේවක ණය එකතුව රු. 555,632 ක් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට පසුගිය වර්ෂ 04 සිට 26ක කාලයක් දක්වා එලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙවැනි නිලධාරීන්ගේ හිඟ ණය අයකර ගැනීමට හෝ අදාල අනුමැතින් ලබාගෙන කපාහැරීමට සුදුසු ක්‍රියාමාර්ග නියමිත කාලයේදි ගත යුතුය. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

## (ඈ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පහත සඳහන් ඇතැම් ලේඛන පවත්වා ගෙන නොමැති අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණයේදී හෙලිදරව් විය. විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(i) ස්ථාවර වත්කම් ලේඛනය:** | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාරව, ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛණය නඩත්තු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |
| **(ii) පරිගනක, පරිගනක උපාංග සහ මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය:** | | |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, පරිගනක, පරිගනක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන නොතිබුණි. | පරිගනක, පරිගනක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණය නඩත්තු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

(iii) **රාජකාරි දුරකථන ලේඛනය:**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාරව, රාජකාරි දුරකථන ලේඛණයක් පවත්වාගෙන නොතිබුණි. | **රාජකාරි දුරකථන ලේඛණය** නඩත්තු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

(iv) **ඇප ලේඛනය:**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව, ඇප තැබිය යුතු නිලධාරීන් සහ සේවකයින්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛණයක් සකස් කර නොතිබුණි. | ඇප ලේඛණය නඩත්තු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

(v) **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය:**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි. | විදුලි උපකරණ සම්බන්ධ ලේඛනය නඩත්තු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

(vi) **පාඩු පිළිබඳ ලේඛනය:**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පාඩු පිළිබඳ ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි. | පාඩු පිළිබඳ ලේඛනය නඩත්තු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

(vii) **ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය:**

| | | |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛණයක් පවත්වා නොතිබුණි. | මෙම කමිටු රැස්වීම් සඳහා පැමිණීමේ ලේඛණය නඩත්තු කිරීමට කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

(viii) **ලංසු කැඳවීමේ ලේඛනය:**

| | | |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛණයක් පවත්වා නොතිබුණි. | ලංසු කැඳවීමේ ලේඛණය නඩත්තු කිරීමට කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

(ඉ) චක්‍රලේඛවලට අනුකූල නොවීම

චක්‍රලේඛවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණකාධිකාරීගේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| චක්‍රලේඛයට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය:** | | | | |
| 1999 ජූනි 11 දිනැති අංක 14/99 දරන චක්‍රලේඛය | 516,000 | සමාලෝචිත වර්ෂයේ ගෞරව බහුමානයෙන් සිදුකළ යුතු ප්‍රකාශය ලබා නොගෙන නිලධාරීන් 04 දෙනෙකුට පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආපදා ණය ගෙවා තිබුණි. | ගෞරව බහුමානයෙන් සිදුකළ යුතු ප්‍රකාශය සම්බන්ධිත නිලධාරීන්ගෙන් ලබාගැනීමට කටයුතු කළ යුතුය. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවතී. |
| 1988 අගෝස්තු 30 දිනැති අංක 29/88 දරන චක්‍රලේඛය | 916,483 | ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් එකඟතාවය ලබානොගෙන නිලධාරීන් 34 දෙනෙකුට ලබාදී තිබූ දෙවර්ෂ ණය අඛණ්ඩව හිඟහිටව පැවතුණි. | ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් එකඟතාවය ලබාගැනීමට ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරී නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂය තුළ සැලැසුම් කළ ආකාරයට භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබානොදීම හේතුවෙන් එකතුව රු.14,510,038ක මූල්‍ය ප්‍රතිපාදනවලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු, ලී බඩු, කාර්යාල උපකරණ සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සහ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා උපයෝජනය කළ නොහැකිවී තිබූ බව නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රතිපාදනයට අදාල අග්‍රිම නියමිත කාලය තුළ ලබා ගැනීමෙන් අදාල අරමුණු ඉටුකර ගැනීමට ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවතී. |

## 2.2 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම්, මූල්‍ය ප්‍රතිපාදන මාරුකිරීම්, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම් සහ උපයෝජනය ඉතිරි කිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක මූලධන වියදම් සඳහා සලසා තිබූ ප්‍රතිපාදන එකතුව රු. මිලියන 245 කින් 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, ඉතිරි කළ යුතුව පැවැති මූලධන වියදම් සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25ක් හෙවත් එකතුව රු. මිලියන 61.25ක් හැර සියයට 60ක් හෙවත් එකතුව රු.මිලියන 148.58ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. ඉන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සහ අප්‍රේල් මාසවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන් (අදියර–II) සඳහා එකතුව රු.මිලියන 190ක ප්‍රතිපාදන සලසා තිබුණි. මෙම කරුණ සම්බන්ධයෙන් අභ්‍යන්තර, ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ලංසු මිල ගණන් කැඳවීමෙහි සහ තාක්ෂණික ඇගයීම් ආදියෙහි සිදුවී තිබූ කාල ප්‍රමාදයන් හේතුවෙන් එම මූල්‍ය ප්‍රතිපාදනය නියමිත පරිදි උපයෝජනය කිරීමට ඵලදායි ක්‍රියාමාර්ග නොගෙන 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛයට අනුකූල වන පරිදි යනුවෙන් සඳහන් කර ආපසු යවා තිබුණි. | මූල්‍ය ප්‍රතිපාදන ඵලදායි ආකාරයෙන් උපයෝජනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කරෙයිතුරෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පුහුණු කිරීම හා හැකියා වර්ධනය වැය විෂයය සඳහා සළසා තිබූ බැරකම් රු.72,150ක් වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේදී ඒ වෙනුවෙන් රු.30,000ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණත් ඉහත බැරකම් කිසිවක් නිරවුල් නොකර වැයකර තිබූ බව නිරීක්ෂණය විය. | බැරකම් හා බැදීම් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු නියමිත කාලයේදී සිදු කළ යුතු වේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින්පවතී. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 30 ක් විසින් එකතුව රු.මිලියන 4,046 ක මුල්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබුණි. එම මුල්‍ය ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 2,909.50 ක් වැයකර තිබුණි. ඉන් රු.මිලියන 1,136.50 ක් හෙවත් සියයට 28 ක් සමාලෝචිත වර්ෂයේ උපයෝජනය කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ විවිධ සංවර්ධන කාර්යයන් වෙනුවෙන් ජනාධිපති කාර්යාලය, අමාත්‍යාංශ 06ක් සහ දෙපාර්තමේන්තුවක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබූ මුල්‍ය ප්‍රතිපාදන උපයෝගි කර කාර්යයන් නියමිත පරිදි ඉටු නොකළ නමුත් ඒවා සම්පූර්ණ කළ බවට සනාථ කිරීම් සිදු කර ගෙවීම් බිල්පත් සකස් කර එකතුව රු.මිලියන 786.15ක බැරකම් හා බැදීම්වලට එළඹ තිබූ බව නිරීක්ෂණය විය. | සත්‍ය වශයෙන් කාර්යයන් භෞතිකව සම්පූර්ණ කළ ප්‍රමාණයට අදාලව කාර්යයන් සනාථ කර ඉන් ගෙවිය යුතු වටිනාකමට සරිලන බැරකම් සඳහා එළැඹීමට කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

## 2.4 අත්තිකාරම් ගෙවීම් හා නිරවුල් කිරීම්

අත්තිකාරම් ගෙවීම් සහ නිරවුල් කිරීම් පිළිබඳ හෙළිදරව් කළ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනාධිපති ඡන්ද රාජකාරියේ යෙදී සිටි සේවක පිරිසකට ගෙවීම් සිදුකිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මැතිවරණ කාර්යාලයට ගෙවාතිබූ අතුරු අග්‍රිම එකතුව රු.1,286,625ක් නිරවුල් කර නොතිබුණි. | නියමිත කාලය තුළ අතුරු අග්‍රිම නිරවුල් කිරීමට ඵලදායි ක්‍රියාමාර්ග ගෙන තිබිය යුතුය. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

## 2.5 තැන්පතු ශේෂ

තැන්පතු ශේෂ සම්බන්ධයෙන් හෙළිදරව් කරනු ලැබූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අදාල අරමුණුගත කාර්යයන් 170ක තැන්පතු, ඇප තැන්පතු 38ක්, | කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුය. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවති. |

ආපසු ගෙවිය යුතු ලංසු තැන්පතු 06ක් සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ග නොගෙන තැන්පතු එකතුව රු.18,724,083ක් පසුගිය මාස 03 සිට වර්ෂ 05ක කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි.

**2.6 බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 396 ට පටහැනිව, පසුගිය මාස 06කට අධික කාලයක් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත්වල එකතුව රු. 21,200ක් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක් විසින් මේ දක්වා ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බැංකුවට ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

---------------

**3.1.1 සැලසුම් කිරීම**

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට දිස්ත්‍රික් ලේකම් කාරයාලය විසින් පසුගිය වර්ෂ 05ක කාලයක් පුරා කටයුතු කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේ සිට සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.1.2 ව්‍යාපෘති නිමකිරිමේ ප්‍රමාදයන්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ |
|---|---|---|

| | | අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ---------------- | ------------------------ |
| දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කර ගනු ලැබූ තීරණවලට අනුව ඉටුකර තිබිය යුතු ව්‍යාපෘති 08ක් මේ දක්වා ඉටු නොකිරීම සහ එහි පසුවිපරම් කටයුතු මන්දගාමී තත්ත්වයක පැවැති බව විගණනයේදි නිරීක්ෂණය විය. | තීරණවලට අනුව එම ව්‍යාපෘති නියමිත කාලය තුළ ඉටුකිරීමට ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |

**3.2 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන්කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | -------------------- |
| (අ) | ලෝක ආහාර වැඩසටහනට අදාල ගබඩාවෙහි වර්ග 66ක ගබඩා අයිතමයන් කිසිවක් ලේඛනගත කිරීමකින් තොරව පසුගිය වර්ෂ 03 සිට 08කට අධික කාලයක් භාවිතයකින් තොරව පැවතුණු බව විගණනයේදි නිරීක්ෂණය විය. | ලේඛනගත කර භාවිතා කිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2020 වර්ෂයේ සිට සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | කාර්යාල පිකප් වාහන 07ක් සහ ලොරි රථ දෙකක්, යතුරුපැදි 06ක් ආදිය පසුගිය වර්ෂ 01 සිට 06ක් දක්වා නියමිත නඩත්තුවක් හෝ අලුත්වැඩියාවන්ගෙන් තොරව පිළිවෙලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වාහන අංගනයේ හා ලෝක ආහාර වැඩසටහන සඳහා වූ ගබඩාව ආදියෙහි නවතා තිබුණි. | අලුත්වැඩියා කර නඩත්තු කිරීමේ කාර්යයන් නියමිත කාලවකවානුවලදි සිදුකළ යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ වර්ෂ 05ක් තිස්සේ අංක WPRB 2647 දරන ට්‍රැක්ටරය භාවිතයකින් තොරව නිෂ්කාරයව පැවතී බව විගණනයේදි නිරීක්ෂණය විය. | හිමිකාරත්වය හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඈ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදුන් විදුලිජනක යන්ත්‍රය පසුගිය වර්ෂ 04කට අධික කාලයක සිට භාවිතා නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවතුණි. එමෙන්ම අවශ්‍ය මාසික සාමාන්‍යය විදුලි පරිභෝජනයට අධික විදුලි බල ශක්තියක් සහිත (502 කිලෝවොට්) නව විදුලි ජනක යන්ත්‍රයක් රු. මිලියන 9.80කට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විදේශ රටකින් (තුර්කිය) ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලිය අනුගමනය කිරීමකින්ද තොරව මිලදී ගෙන තිබුණි. | කාර්යක්ෂමතාවයෙන් යුත් ක්‍රමවේදයක් ස්ථාපිත කර භාවිතා කිරීමට ඵලදායි ක්‍රියාමාර්ග නියමිත කාලය තුළ ගනු ලැබිය යුතුවේ. | ඉදිරි අනාගතයේදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 3.3 බැඳීම් හා බැරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නිදහස් කර තිබූ මුල්‍ය ප්‍රතිපාදනයෙන් ක්‍රියාත්මක කර තිබූ කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (Gamperaliya), ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන (RIDP), ග්‍රාමීය සංවර්ධන සැලැසුම් (REEP), සංවර්ධන සහාය සැලසුම් වැඩසටහන් (DCB) සහ යටිතල පහසුකම් වැඩසටහන් (TFR) ආදි වැඩසටහන් 19ක් පූර්ණ වශයෙන් අවසන් කර නොතිබුණි. එසේවුවත්, අදාල වැඩසටහන් ඉටුකර අවසන් වූ බවට අවිධිමත් ආකාරයෙන් මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයෙහි බැරකම් ලෙස එකතුව රු.19,143,771ක් දක්වා තිබූ බව විගණන පරීක්ෂාවේදි නිරීක්ෂණය විය. | කාර්යයන් අවසන් කර ඒ පදනම්ව කාර්යයන් ඉටුකළ බවට සනාථ කළ බිල්පත්වලට පමණක් බැරකම්වලට එළැඹිය යුතුවේ. | ඉදිරි අනාගතයේදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 3.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර්යාල වාහනවලට සිදු වී තිබූ විවිධ අනතුරු සම්බන්ධයෙන් එහි හානිය තක්සේරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් නොකළ අවස්ථා 07ක් විගණනයේදි නිරීක්ෂණය විය. | සෑම අනතුරකදීම සිදුවූ පාඩු හා හානි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකශනවල හෙළිදරව් කළ යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |

## 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහ ගණන්දීමේ නිලධාරී යන අය වෙත නිකුත් කර තිබූ විගණන විමසුම් 12කට අදාල තොරතුරු හා පැහැදිලි කිරීම් පසුගිය මාස 01 සිට වර්ෂ 03ක කාලයක් තිස්සේ විගණනයට ලැබී නොතිබුණි. | නියමිත කාල පරාසය තුළ විගණන විමසුම්වලට අදාල පිළිතුරු ඉදිරිපත් කළ යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |

## 4. තිරසාර අරමුණු ළඟාකර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සෑම රජයේ ආයතනයක්ම එක්සත් ජාතීන්ගේ රටවල් සඳහා වූ තිරසාර සංවර්ධන ඉලක්ක වැඩසටහන 230හි න්‍යාය පත්‍රයට අනුකූලවත් 2017 ඔක්තෝබර් 03 දිනැති 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත අනුගමනය කර ක්‍රියාත්මක කළ යුතු අතර චක්‍රලේඛ මගින් ඉහත කරුණ පිළිබඳව සියළුම රාජ්‍ය ආයතන දැනුවත් කර තිබුණි. එයට අනුකූලව සියළුම රජයේ ආයතන අදාල ආයතනයේ බලසීමාව යටතට ගැනෙන කාර්යයන් පිළිබඳව කෙසේ කටයුතු කළ යුතුද යන්න දැන සිටිය යුතුය. නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉහත කරුණ පිළිබඳව නොදැනුවත්ව සිටි බැවින් මෙහි කර්තව්‍යයන් සම්බන්ධ අරමුණු, ඉලක්ක සහ මෙම ඉලක්ක ළඟාකර ගැනීම මැනීම සඳහා අවශ්‍ය දර්ශක ආදිය හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන චක්‍රලේඛවල සඳහන් ආකාරයට සැලසුම් සකස්කර කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි අනාගතයේදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 5. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 5.1 මහජනතාවට සේවාවන් ඉටුකිරිම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශ 04ක මහජනතාව/සේවා ලබන්නන් විසින් ඉදිරිපත් කරනු ලැබූ නිවාස වැඩසටහන් පැමිණිලි 33ක් සම්බන්ධයෙන් සෝදිසි විමර්ශන වාර්තා මුලතීව් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත භාරදී තිබුණි. නමුත් මෙම විමර්ශන වාර්තා ප්‍රකාරව ක්‍රියාත්මක කර තිබූ ක්‍රියාමාර්ග සහ ඒ පිළිබඳ පැමිණිලිකරුට දැනුම් දී නොතිබීම, ඒ පිළිබඳ මැලිකමක් දැක්විම/ නොසැලකිලිමත්බව ආදිය විගණනයේදි නිරික්ෂණය විය. කෙසේවෙතත් මුලතීව් | මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන ඒ පිළිබඳව ඔවුන්ට නියමිත භාෂාවෙන් අදාල කාලය තුළ දැනුම්දීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරි අනාගතයේදි ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් මහජනතාව වන සේවා ලබාගන්නන් විසින් ලිඛිතව සිදුකළ පැමිණිලි සම්බන්ධයෙන් ඔවුන්ට 2015 මැයි 20 දිනැති අංක 11/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 03 ඡේදය ප්‍රකාරව දැනුම් දී නොතිබූ බව විගණනයේදි නිරීක්ෂණය විය.

## 6. මානව සම්පත් කළමනාකරණය

## 6.1 අනුමත කළ කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය සහ සේවක වේතන සඳහා වියදම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ ආකාරයට මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රා දේශීය ලේකම් කාර්යාල 06ක වර්ග 04ක තනතුරුවලට අදාල කාර්යල මණ්ඩලය 34ක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබූ නිසා එවැනි තනතුරුවලට අදාල රාජකාරි ඉටු කිරීමට නොහැකි වීම, රාජකාරි ඉටු කිරීමෙහි කාල ප්‍රමාදය, දුර්වල තත්ත්වය ආදිය විගණනයේදි නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, පසුගිය වර්ෂ 10ක කාලයේදි ඉහත තනතුරු පුරප්පාඩු වී පැවැතුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු නියමිත කාලයේදි පිරවීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ආ) | සංවර්ධන නිලධාරී සහ කළමනාකරණ සේවා නිලධාරීන් ව්‍යාප්ත කිරීමෙහිදි මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සේවාවේ ස්වභාවය, පුරප්පාඩුවේ අනුපාතයේ ප්‍රවණතාව ආදිය පිළිබඳ නොසලකා නගරාශ්‍රිතව පවතින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කරෛයිතුරෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත එම කාර්ය මණ්ඩලය ව්‍යාප්ත කර තිබුණි. මේ නිසා මෙම ලේකම් කාර්යාලවල ඉහත තනතුරු සඳහා පුරප්පාඩු සියයට 01 සිට සියයට 48ක් දක්වා පරාසයකත් ඒවාට සාපේක්ෂව කාර්ය මණ්ඩල පුරප්පාඩු නාගරික ප්‍රදේශයෙන් දුරස්ථව පිහිටි වැලිඔය, තුනුක්කායි, මාන්තායි නැගෙනහිර සහ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශ ජනතාවට අදාල සේවා සැපයීම සඳහා | ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර කාර්ය මණ්ඩලය ව්‍යාප්ත කිරීමට අවශ්‍ය ඵලදායි ක්‍රියාමාර්ග නියමිත කාලය තුළදි ගත යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | ඉහත කළමනාකරණ සේවා නිලධාරී තනතුරු සඳහා පුරප්පාඩු ව්‍යාප්ත නොකර සියයට 56ක සිට සියයට 65ක් දක්වා පරාසයක් පුරප්පාඩුවීමට සලස්වා තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා පරිපාලන සේවා ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කළ යුතු මෙම දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ රාජකාරි සියල්ල පසුගිය වර්ෂ 04කට අධික කාලයක සිට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවාවේ ශ්‍රේණියට අයත් නිලධාරියෙකුගේ වැඩ බැලීම මත ක්‍රියාත්මක කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් අනුමත කළ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ශ්‍රේණියට අයත් නිලධාරියෙකුට නියමිත රාජකාරි සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලයෙනුත් නිලධාරින් 08දෙනෙකුගේ සංඛ්‍යාවක පුරප්පාඩු පැවතුණු බවත් විගණනයේදි නිරීක්ෂණය විය. | අනුමත කළ තනතුරුවලට අයත් නිලධාරීන් ඒවාට සම්බන්ධිත නියමිත තනතුරුවලට අනුයුක්ත කර සේවාවන් සැපයීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |